SLGURU.LK

# කලාප අධ්‍යාපන කාර්යාලය කොළඹ - ශ්‍රී ජයවර්ධනපුර
வலயக் கல்வி காரியாலயம் கொழும்பு – ஸ்ரீ ஜயவர்தனபுரம்
Zonal Education Office Colombo - Sri Jayawardhanapura

දෙවන වාර පරීක්ෂණය - 2025
இரண்டாம் தவணைப் பரீட்சை - 2025
Second Term Test - 2025

## 10 ශ්‍රේණිය - ඉතිහාසය

**1 පත්‍රය** **කාලය පැය 01**

---

සැලකිය යුතුයි:

I. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වේ.
II. අංක 01 සිට අංක 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1) (2) (3) (4) උත්තර වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
III. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතරින් වඩාත් පැරණිතම මූලාශ්‍රය ලෙස සැලකෙන්නේ,
(1) ථූපවංසය . (2) මහාවංසය (3) දීපවංසය, (4) නිකාය සංග්‍රහය

02. මහාවංසය වඩාත් විශ්වාසනීය මූලාශ්‍රයක් ලෙස සැලකිය හැක්කේ,
(1) උගත් භික්ෂුවක් වූ මහානාම හිමි විසින් රචනා කොට තිබීම නිසාය.
(2) ක්‍රිස්තු වර්ෂ පහ හෝ හය සියවසෙහි පමණ රචනා වීම නිසාය.
(3) යුනිස්කෝව මගින් ලෝක උරුමයක් බවට පත් කළ නිසා ය.
(4) එහි ඇතැම් කරුණු සෙල්ලිපි හා වෙනත් මූලාශ්‍ර මගින් තහවුරු වන නිසාය.

03. ශ්‍රී ලංකාවට පැමිණ, මෙහි ඇති තතු දැක බලා රචනා කළ විදේශීය සාහිත්‍ය මූලාශ්‍රයකි,
(1) පාහියන් හිමිගේ දේශාටන වාර්තා (2) ඇරිස්ටෝටල්ගේ ඩිමෙන්ඩෝ කෘතිය
(3) ප්ලිනිගේ නැචුරල් හිස්ටෝරියා කෘතිය (4) හියුං සියැං හිමිගේ දේශාටන වාර්තාව

04. පළමුවන විජයබාහු රජතුමා විසින් ලියවන ලද පනාකඩුව තඹ සන්නස පිරිනමන ලද්දේ,
(1) දෙවන විජයබාහු රජතුමාට ය. (2) සිත්නාරුබිම බුදල්නා තුමාට ය.
(3) රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානියාට ය. (4) තකදිව සිටි සෘෂිගිරි ඇමතිවරයාට ය.

05. පහත සඳහන් මූලාශ්‍රවලින් අප රටේ ආර්ථිකය පිළිබඳ හඳුනා ගැනීමට ඉවහල් වන ප්‍රධානතම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් වන්නේ,
(1) සීගිරි බිතු සිතුවම් (2) දැදිගම ඇත් පහන
(3) අනුරාධපුරයේ ගල්පාලම (4) අක නම් රන්කාසිය

06. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයක් ලෙස හඳුනාගෙන ඇත්තේ,
(1) සීගිරියේ පොතාන (2) පාහියන්ගල
(3) බෙල්ලන්බැඳි පැලැස්ස (4) පතිරාජ වෙල


SLGURU.LK
Education Purpose Only

07. ප්‍රාග් මානවයාගේ ජීවන රටාවට අදාළ පහත සඳහන් තොරතුරු අතරින් නිවැරදි තොරතුරක් නො වන්නේ,

(1) කුඩා කණ්ඩායම් ලෙස සංවිධානය වී සිටීම ය
(2) වර්ෂා කාලයේ දී ස්වභාවික ගල්ගුහාවල ජීවත් වීම ය
(3) ගංගා නිම්නයට පිටතින් තම ජනාවාසය ඉදිකර ගැනීම ය.
(4) දඩයම සහ තැන තැන ඇවිදිමින් ආහාර එකතු කිරීම ය.

08. මාංශ ජනක ආහාර ලෙස ගස්ගොළුබෙල්ලන් ආහාරයට ගත් ප්‍රාග් මානවයා ජීවත් වූ පරිසර කලාපය වූයේ,

(1) පහත රට වියලි කලාපය
(2) පහතරට තෙත් කලාපය
(3) අර්ධ ශුෂ්ක කලාපය
(4) පහතරට අතරමැදි වියළි කලාපය

09. පුරාණ කාලයේ ඉදි කළ ඇළහැර ඇළ මගින් පෝෂණය වූ වැව් වූයේ,

(1) මින්නේරිය, ගිරිතලේ සහ කන්තලේ වැව් ය.
(2) මින්නේරිය, හුරුලු වැව සහ නාච්චදූව වැව් ය.
(3) ගිරිතලේ, ඉරණමඩු සහ කන්තලේ වැව් ය
(4) මින්නේරිය, සොරබොර වැව සහ කන්තලේ වැව් ය.

10.පූර්ව ඓතිහාසික මානවයා සකපෝරුව භාවිතයෙන් සෑදූ සමමිතික වළං හමු වූ ස්ථානය වන්නේ,

(1) බෙරගල (2) රංචාමඩම (3) සමනල වැව (4) උඩරංචාමඩම

11. පූර්ව ඓතිහාසික මානවයා වෙනුවෙන් ඉදිකොට ඇති මහාශිලා සුසාන හමු වූ ස්ථානයකි,

(1) ඉබ්බන්කටුව (2) රංචාමඩම (3) හල්දුම්මුල්ල (4) බෙරගල

12. බ්‍රාහ්මී සෙල්ලිපිවල අවරණ යන වචනයෙන් දැක්වෙන අදහස වන්නේ,

(1) වැව යන්නයි
(2) පාලම යන්නයි
(3) රළපනාව යන්නයි
(4) අමුණ යන්නයි.

මුල් ඓතිහාසික යුගයේ මානවයන් වෘත්තින් ලෙස සංවිධානය වූ ගම් (අ) තීරුවේ ද එම ගම් සාහිත්‍ය මූලාශ්‍රයන්හි සඳහන් ව ඇති ආකාරය (ආ) තීරුවේ ද දැක්වේ.

| අ | ආ |
|---|---|
| A. ගොවියන් විසූ ගම් | E. කේවට්ට ගාම |
| B. ගොපල්ලන් විසූ ගම් | F. කුම්භකාර ගාම |
| C. ධීවරයන් විසූ ගම් | G. ගෝපාලගාම |
| D. වලං සාදන්නන් විසූ ගම් | H. කසීකාර ගාම |

13. ඉහත වෘත්තීන් අතරින් කෘෂිකර්මාන්තයෙහි නියැලුණු ජනතාව විසූ ගම් පිළිබඳ ව නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) AE (2) AH (3) BF (4) CG

14. ගම නියෝජනය කිරීමට නායකයෙකු තෝරාගන්නා ලද්දේ,

(1) ගෘහපතීන් අතරිනි.
(2) පරුමකයින් අතරිනි.
(3) මපරුමුකයන් අතරනි.
(4) පරුමකලු අතරිනි

15. වියලි කලාපයේ වැසියන් විසින්, වැව් පද්ධතියක් හැඳින්වීමට භාවිත කළ වචනය වූයේ,

(1) වැව් ඉස්මත්ත (2) පට්ටනගාම (3) වැව් ගම්මාන (4) එල්ලංගාව



SLGURU.LK
Education Purpose Only

16. සෙල්ලිපිවල, නරේශ්වර ලෙස තමන් හඳුන්වා දුන් රජතුමා කවුද?

(1) කුටකණ්ණ අභය රජු.
(2) නිශ්ශංක මල්ල රජු.
(3) මහසෙන් රජු.
(4) දුටුගැමුණු රජු.

17. සහෝදරයාගෙන් සහෝදරයාට රජකම උරුම වූ අවස්ථාවක් ලෙස සැලකිය හැක්කේ,

(1) කාවන්තිස්ස රජතුමාගෙන් දුටුගැමුණු කුමරුට රජකම හිමි වීම.
(2) වසභ රජුගෙන් වංකනාසික තිස්ස කුමරුට රජකම හිමි වීම.
(3) දුටුගැමුණු රජතුමාගෙන් සද්ධාතිස්ස කුමරුට රජකම හිමි වීම.
(4) ධාතුසේන රජුගෙන් මුගලන් කුමරුට රජකම හිමි වීම.

18. පැරණි සෙල්ලිපිවල එම සමාජයේ නාගරික වාස්තු විද්‍යාඥයා හඳුන්වා දී ඇත්තේ,

(1) නගර ගුතික ලෙසිනි.
(2) නගර වුඩික ලෙසිනි
(3) කනපෙඩික ලෙසිනි
(4) කොතුරු ගැ නා ලෙසිනි

19. පහත කරුණු හා සම්බන්ධ රජතුමා ලෙස සැලකෙන්නේ,

- ප්‍රථම වරට සංවිධානාත්මක සටන් ව්‍යාපාරයක් මෙහෙයවීම
- මධ්‍යගත පාලනයේ ආරම්භක රජතුමා වීම
- රෝහල් 18ක් ඉදි කරවීම

(1) මහසෙන් රජු ය.
(2) වසභ රජු ය.
(3) දුටුගැමුණු රජු ය.
(4) පණ්ඩුකාභය රජු ය.

20. ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කර වූ වරාය වූයේ,

(1) මාතොට
(2) දඹකොළ පටුන
(3) ලංකා පටුන
(4) ත්‍රිකුණාමල වරාය

21. හය වන අග්ගබෝධි රජුගේ පාලන සමයේ දී, විසි වතාවක් ලංකාවෙන් රාජතාන්ත්‍රික දූත ගමන් යෙදුණු රට වූයේ,

(1) ඉන්දියාව
(2) පර්සියාව
(3) අරාබිය
(4) චීනය

22. ක්‍රිස්තු වර්ෂ 9 සියවසේ දී රචනා කරන ලද සෙල්ලිපියක දක්වා ඇති සංකේත අතරින් හංසයා සලකුණ මගින් නිරූපණය වන්නේ,

(1) දීමනාවේ පවිත්‍රත්වයයි
(2) දීමනාවට බාධා නොකළ යුතු බවයි
(3) රාජකීයත්වයයි
(4) දිගු කල් පවතින බවයි.

23. පැරණි කාලයේ දී සෙල්ලිපිවල පිටබිම් ලෙස හඳුන්වා තිබෙන්නේ,

(1) හේන් ය.
(2) ගෙවතු ය.
(3) කුඹුරු ය.
(4) ක්ෂේත්‍ර ය.

24. අතීතයේ සිටම අන්තර්ජාතික වෙළෙඳ කටයුතුවල දී අපගේ රට වැදගත් වීමට බලපෑ ප්‍රධානතම හේතුව වූයේ,

(1) ලංකාවේ ත්‍රිකුණාමලය වරාය විශාල වීම ය.
(2) රජවරුන් විදේශ වෙළඳාම කෙරෙහි උනන්දු වීම ය.
(3) ශ්‍රී ලංකාව ඉන්දීය සාගරයේ මධ්‍යගතව පිහිටීම ය.
(4) ලංකාව කුඩා දූපතක් වීම ය.

25. ක්‍රිස්තු වර්ෂ හත වන සියවස වන විට මෙරට මාතොට වරාය ට සම්පව සැලකිය යුතු තරමේ හින්දු ප්‍රජාවක් වාසය කළ බවට සාක්ෂි සපයන කෝවිල වන්නේ,

(1) කෝනේෂ්වරම් කෝවිල
(2) නල්ලූර් කෝවිල
(3) මුන්නේශ්වරම් කෝවිල
(4) තිරුකේතීශ්වරම් කෝවිල



SLGURU.LK
Education Purpose Only

26. ක්‍රිස්තු වර්ෂ 12 වන සියවසේ දී දළදා මාලිගයේ ආරක්ෂාවට වේලෛයික්කාර හමුදාව යෙද වූ රජතුමා වූයේ,

(1) දුටුගැමුණු රජතුමා ය. (2) පළමු වන විජයබාහු රජතුමා ය.
(3) පළමු වන පරාක්‍රමබාහු රජතුමා ය. (4) පළමු වන විමලධර්මසූරිය රජතුමා ය.

27. ක්‍රිස්තු පූර්ව 1350 දී පමණ මෙරට ජීවත් වූ වැසියන් දහනයට ඔක්සිජන් වායුව අවශ්‍ය යැයි දැන සිටි බවට සාධකයක් වන්නේ,

(1) ඇඳිගම ඇත් පහන ය (2) ශිලා මංජුසා සොහොන් ය.
(3) හරනි සුසාන ය. (4) මැටිඹරු සුසාන ය.

28. පැරණි සමාජයේ ධර්මය කොටස බැගින් මතකයේ තබාගත් භික්ෂූන් වහන්සේලා හඳුන්වන ලද්දේ,

(1) භාණකවරුන් ලෙසිනි (2) අන්තේවාසික ලෙසිනි
(3) වසවසික ලෙසිනි (4) සද්ධිවිහරිය ලෙසිනි

29. පීඩනයකින් යුතුව පවතින වැවේ ජලය ඇළ මාර්ගයට මුදා හැරීමට ඉදි කොට ඇති වැවෙහි අංගය ලෙස සැලකෙන්නේ,

(1) වැව් බැම්ම (2) බිසෝ කොටුව (3) සොරොව්ව (4) රළපනාව

30. සීගිරි ජල මල් ක්‍රියාත්මක වීමේ දී එම ජල මල්වල උස වෙනස් කිරිමට සීගිරි නිර්මාණ ශිල්පීන් යොදා ඇති පැරණි තාක්ෂණය වන්නේ,

(1) අඩි 600 ක් පමණ ඉහළ සිට ජලය පහළට ගලා යැවීම යි
(2) ජලය ගලා යන කානුවල රොන්මඩ ඉවත් කොට පිරිසිදුව තැබීම ය.
(3) ගල් පතුරෙහි විදි සිදුරු වල විෂ්කම්භය වෙනස් කිරීම ය.
(4) ජලය ගලා යන කානු පද්ධතිය දහරාකාර ව සකස් කිරීම ය.

31. පැරණි රෝහලක නටබුන් හමු වූ පොළොන්නරුවේ පිහිටි ආගමික ස්ථානයකි,

(1) මහා විහාරය (2) ආලාහන පිරිවෙන
(3) ලෝවාමහාපාය (4) අභයගිරි විහාරය

32. ගවයින්ගේ ආරක්ෂාව සඳහා කිරිමඩු ශාන්ති කර්මය කළ බවට සාක්ෂි හමු වූයේ,

(1) උඩරංචාමඩම ප්‍රදේශයෙනි. (2) රත්නපුර ගල්පාය ප්‍රදේශයෙනි
(3) යටිගල්පොත්ත ප්‍රදේශයෙනි (4) හල්දුම්මුල්ල ප්‍රදේශයෙනි

33. පොළොන්නරු යුගයේ දී දුර මැනීම සඳහා ගාවුත කණු සිටුවන ලද රජතුමා වූයේ,

(1) දුටුගැමුණු රජතුමා (2) මහසෙන් රජතුමා
(3) නිශ්ශංක මල්ල රජතුමා (4) වසභ රජතුමා

34. ලාංකීය පැරණි ශිල්පීන් ස්ථිතික ජලවිද්‍යා මූලධර්මය යොදා ගනිමින් ක්‍රියාත්මක කළ විශිෂ්ට නිර්මාණය කුමක්ද?

(1) මාදුරු ඔයෙහි සොරව්ව (2) මල්වතු ඔය හරහා ඉදි කළ ගල්පාලම
(3) උඩරංචාමඩමින් හමු වූ මැටි බඳුන (4) ඇඳිගම ඇත් පහන

35 පැරණි කාලයේ දී සෙල්ලිපිවල සභාව ලෙස හඳුන්වා ඇත්තේ,

(1) රාජසභාව යි (2) අධිකරණය යි
(3) ප්‍රධාන ඇමතිවරුන් ය (4) ආගමික ආයතන ය



SLGURU.LK
Education Purpose Only

36. පහත අ තීරුවෙහි සඳහන් නීතිරීති සහ ආ තීරුවෙහි සඳහන් සෙල්ලිපි පිළිවෙළින් ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. නිසි කලට සීසෑම නො කරන පුද්ගලයන්ට කලං පහක දඩයක් අය කිරීම | A. වෙස්සගිරි සෙල්ලිපිය |
| 2. වැව් වලින් ගොවිතැන් කරන කුඹුරුවල සිහිනැටි වී මිස මුං වැපිරීම නො කළ යුතු බව | B.හෝපිටිගමුව සෙල්ලිපිය |
| 3. සොහොය දිනවල වෙළඳාම් කළ අයගෙන් දඩයක් ලෙස තෙල් බඳ්දක් ලබාගත යුතු බව | C. මිහින්තලා පුවරු ලිපිය |
| 4. මී හරකුන්, එළ හරකුන් හා එවැනි ඝාතනය කරන අයට මරණ දඬුවම් නියම කිරීම | D. කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය |
| | E. වේවැල්කැටිය සෙල්ලිපිය |

(1) A B D E (2) B C D E (3) C A B E (4) D A B C

37.ක්‍රිස්තු පූර්ව 250 දී පමණ හස් එබු නම් රිදී කාසි විශේෂය මෙරටට ගෙන එනු ලැබූයේ,

(1) චීනයේ සිට ය. (2) පර්සියාවේ සිට ය.
(3) උතුරු ඉන්දියාවේ සිට ය. (4) අරාබියේ සිට ය.

ප්‍රශ්න අංක 38, 39, 40 යන ප්‍රශ්න සඳහා පහත කරුණු ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A. 1. රට තුළ වෙළඳාම මැනවින් පවත්වාගෙන යාම
2. සොරබොරවැව ටැම් ලිපිය

B. 1. සකපෝරුව භාවිත කිරීම
2. උසස් නිමාවකින් යුතු මැටි බඳුන් නිපදවීම

C 1. අනුරාධපුර යුගයේ මහ වැව් තැනවීම
2. බොහෝ රජවරුන් මහ වැව් තනවා තිබේ.

D. 1. ලීලාවතී රැජින මෙරට තෙවරක් රජ වීම
2. වසභ රජතුමා විසින් පරිපාලන දිස්ත්‍රික්ක වෙන් කිරීම

38. පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස දෙවැන්න බිහි වූ පද යුගලය කුමක්ද?

(1) A (2) B (3) C (4) D

39. දෙවැන්න පදනම් කර ගෙන පළමුවැන්න සාර්ථකව ක්‍රියාත්මක විය.

(1) A (2) B (3) C (4) D

40. පළමුවැන්න සහ දෙවැන්න අතර සම්බන්ධයක් නො දක්වන පද යුගලය කුමක්ද?

(1) A (2) B (3) C (4) D


SLGURU.LK
Education Purpose Only

**කලාප අධ්‍යාපන කාර්යාලය කොළඹ - ශ්‍රී ජයවර්ධනපුර**
**வலயக் கல்வி காரியாலயம் கொழும்பு – ஸ்ரீ ஜயவர்தனபுரம்**
**Zonal Education Office Colombo - Sri Jayawardhanapura**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2025**
**Second Term Test - 2025**

10 ශ්‍රේණිය - ඉතිහාසය

II පත්‍රය | කාලය: පැය 03

උපදෙස් :

- I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 6කි.

I කොටස

**01.**

(අ) පහත (I) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමෙහි ද (II) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

I. අනුරාධපුරය, පොළොන්නරුව, යාන් ඔය, කැලණි ගඟ, යෝධ වැව, මින්නේරිය වැව, මාතොට, බුන්දල, සීගිරිය, මිහින්තලේ, ගෝකණ්ණතිත්ථ, පාහියන්ගල (ලකුණු - 12)


II. රෝමය, පෘතුගාලය, බ්‍රිතාන්‍ය, අරාබිය, මලය අර්ධද්වීපය, බෙංගාල බොක්ක (ලකුණු - 06)

(ආ) (i) පහත A, B ,C , D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන්/ ස්ථාන අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. මුල්ම ලෝක සිතියම අඳිනු ලැබූ ග්‍රීක රෝම ජාතිකයා නම් කරන්න.
B. වකුටු කොට වල දැමූ ප්‍රාග් මානව ඇටසැකිලි හමු වූ ස්ථානය කුමක් ද?
C. තම දසවන රාජ වර්ෂයේ දී දිවයිනේ ග්‍රාම සීමා ලකුණු කිරීම සිදු කළ රජතුමා නම් කරන්න.
D. අලුතින් ගිනි තබා සකස් කළ හේන හැඳින්වූ නම කුමක් ද ? (ලකුණු 1 × 4)

(ii) A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A රූපය




1. ඉහත A රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
2. මෙම ස්ථානය පිහිටා ඇති ප්‍රදේශය කුමක් ද?
3. මෙම ස්ථානය අයත් ඓතිහාසික යුගය නම් කරන්න.
4. එම යුගයේ මේවා භාවිත කොට ඇත්තේ කවුරුන් විසින් ද?

( ලකුණු 1 × 4 )



SLGURU.LK
Education Purpose Only

B රූපය



(iii)

1. B රූපයෙන් දැක්වෙන්නේ කවුරුන් ද?
2. මෙම ප්‍රතිමාව පිහිටි නගරය නම් කරන්න.
3. මොහු දූතයන් යැවූ විදේශීය රට නම් කරන්න.
4. මෙම ප්‍රතිමාව ඉදිකොට ඇති ස්ථානයේ පවතින දාගැබ නම් කරන්න.

(ලකුණු 1 × 4)

## II කොටස

**02.**

I. පුරාවිද්‍යා කැණීම්වල දී ලංකාවෙන් හමු වූ විදේශීය කාසි වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 3)

II. ඉතිහාසය ගොඩනැගීමට සාහිත්‍ය මූලාශ්‍ර යොදාගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න. (ලකුණු 4)

III. පුරාවිද්‍යා මූලාශ්‍ර විනාශ වන ආකාර දෙකක් නම් කොට කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම කරුණු තුනක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 6)

**03.**

I. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පරිසර කලාප තුනක් නම් කරන්න. (ලකුණු 3)

II. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ කැපී පෙනුණු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)

III. පූර්ව ඓතිහාසික යුගයේ ජනතාව තම මියගිය ඥාතීන් වෙනුවෙන් ඉදි කොට ඇති සුසාන වර්ග දෙකක් නම් කොට එම සුසාන වර්ග දෙක පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5)

IV. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක තුනක් නම් කොට, ඒවා විස්තර කරන්න. (ලකුණු 6)

**04.**

I. පහත දැක්වෙන තනතුරු නාම පූර්ව රාජ්‍ය සමයේ දී හැඳින්වූ ආකාරය අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. පවුලක ප්‍රධානියා B. ගමක ප්‍රධානියා C. ප්‍රදේශයක ප්‍රධානියා (ලකුණු 3)

II. පැරණි සමාජයේ ගමිකයන් විසින් ඉටු කළ කාර්යයන් දෙකක් නම් කරන්න. (ලකුණු 4)

III. පැරණි සමාජය තුළ රජතුමාගෙන් ජනතාවට සිදු වූ සේවාවන් දෙකක් නම් කොට, කෙටියෙන් පැහැදිලි කරන්න.

IV. දුටුගැමුණු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය කරුණු තුනක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

**05.**

I. ඕනෑම රටක පාලනය මෙහෙයවන ප්‍රධාන ආයතන තුන නම් කරන්න. (ලකුණු 3)

II. පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ලැබුණු ප්‍රධාන ආකාර දෙක ලියන්න. (ලකුණු 4)

III. අතීතයේ රජවරු විදේශ සම්බන්ධතා ඇතිකර ගත් ආකාරය උදාහරණ දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. පැරණි සමාජයේ මෙරට විසූ ජනතාව විවිධ ජනවර්ග සමඟ සහජීවනයෙන් කටයුතු කළ ආකාරය උදාහරණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)



SLGURU.LK
Education Purpose Only

06.

I. පහත සඳහන් වැව් ඉදිකරවූ රජවරු අනුපිළිවෙලින් නම් කරන්න

A. කලා වැව.

B. කවුඩුල්ල වැව.

C. පදවිය වැව (ලකුණු 3)

II. පහත සඳහන් වැවෙහි අංගවලින් සිදු වූ කාර්යය එක බැගින් පිළිවෙලින් ලියන්න.

A. රළපනාව

B. සොරොව්ව (ලකුණු 4)

III. පැරණි සමාජයේ යකඩ නිස්සාරණය කළ බවට සාක්ෂි සපයන පැරණි යකඩ උඳුන් හමු වූ ස්ථාන දෙකක් නම් කොට එම උඳුන් ක්‍රියාත්මක කළ ආකාරය වෙන් වෙන් ව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. පැරණි සමාජයේ කාන්තාවන් ගෞරවයට පාත්‍ර වූ අවස්ථා 3ක් නම් කර උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 6)

07.

I. ඓතිහාසික යුගයේ දී ආහාරය සඳහා බහුලව භාවිත වූ ධාන්‍ය වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 3)

II. සොරබොරවැව වැම් ලිපියේ සඳහන් වන පරිදි හෝපිටිගමුව වෙළඳපොළ සම්බන්ධව හතරවන උදය රජු විසින් පනවා තිබූ නීති දෙකක් ලියන්න. (ලකුණු 4)

III. අතීත ලාංකිකයන් දේශීය ආහාර කෙරෙහි අවධානය යොමු කොට ඇති ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. අතීත පාලකයන් පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග 3ක් නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 6)

08.

I. පැරණි ලාංකීය සමාජය විදේශීය වෙළඳාම් පැවැත්වූ රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 3)

II. ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ පැවති වෘත්තීන් හතරක් නම් කරන්න. (ලකුණු 4)

III. අතීතයේ දී මෙරට වෙනත් ආගම් ඇදහූ ජනතාව සිටි බවට උදාහරණ දෙකක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ ගැමියන්ගේ ප්‍රධාන ජීවන වෘත්තීය වූ ගොවිතැන ප්‍රධාන කොටස් තුනකි. එම කොටස් තුන නම් කොට, පැහැදිලි කරන්න. (ලකුණු 6)

----- // ----



SLGURU.LK
Education Purpose Only